ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා වැඩසටහන - 2024/2025
අවසාන පරීක්ෂණය - 2025
**SNP8348/SNP8338- අධ්‍යාපනයේ මාර්ගෝපදේශය හා උපදේශනය**
කාලය - පැය තුනයි. (03)

---

දිනය - 2025.07.27 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

1 වන කොටසේ සියලුම ප්‍රශ්න වලටද 2 වන කොටසින් ඕනෑම ප්‍රශ්න තුනකටද (3) පිළිතුරු සපයන්න.

## 1 වන කොටස

1. අධ්‍යාපනික මාර්ගෝපදේශනය සහ අධ්‍යාපනික උපදේශනය අතර ඇති වෙනස්කම් උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

2. විශේෂ අවශ්‍යතා ඇති දරුවන්ට උපකාර කිරීමේදී ගුරුවරයෙකුට මාර්ගෝපදේශනය සහ උපදේශනය පිළිබඳ දැනුම ප්‍රයෝජනවත් වන ආකාරය උදාහරණ දෙකක් (02) භාවිත කරමින් කෙටියෙන් විස්තර කරන්න.

3. උපදේශනයේදී භාවිත කරන මනෝවිශ්ලේෂණාත්මක ප්‍රවේශයේ මූලික මූලධර්ම තුනක් (03) විස්තර කරන්න.

4. සංවර්ධනාත්මක අක්‍රමිකතා සහිත දරුවන් සඳහා ලබාදෙන උපදේශන ක්‍රියාවලියේදී මුල් අවස්ථාවේම හඳුනාගැනීමේ සහ මැදිහත්වීමේ වැදගත්කම පැහැදිලි කරන්න.

5. ආබාධිතභාවය හා සම්බන්ධ සමාජ අපකීර්තියන් සමඟ කටයුතු කිරීමේදී සහ ඒවාට අභියෝග කිරීමේදී පාසල් උපදේශකයින්ගේ කාර්යභාරය සාකච්ඡා කරන්න.

6. පාසල් පරිසරය තුළ සම වයස් මිතුරන් ප්‍රතික්ෂේප කිරීම සහ බැහැර කිරීම විශේෂ අවශ්‍යතා සහිත ළමයින්ගේ සමායෝගී බව කෙරෙහි බලපාන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

7. කාල් රොජර්ස්ගේ පුද්ගල කේන්ද්‍රීය උපදේශන ප්‍රවේශය කායික ආබාධ සහිත දරුවන්ගේ ආත්ම අභිමානය සහ චිත්තවේගීය යහපැවැත්මට උපකාර කිරීම සඳහා යොදා ගත හැක්කේ කෙසේද? අදාළ උදාහරණ දෙකකින් පැහැදිලි කරන්න.

8. ආබාධ සහිත පුද්ගලයින්ට වෘත්තීය මාර්ග සඳහා මග පෙන්වීමේදී Eli Ginzberg ගේ වෘත්තීය තේරීම පිළිබඳ න්‍යායේ අදාළත්වය පැහැදිලි කරන්න.

(ලකුණු 05x08 = ලකුණු 40)

## 2 වන කොටස

9. (i) 'සමායෝජිබව' යන්න නිර්වචනය කර එහි වැදගත්කම මානව හැසිරීම සහ පරිසරය යන සන්දර්භයන් යොදා ගනිමින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(ii) දරුවන්ගේ චිත්තවේගීය ස්ථාවරත්වය සහ සමායෝජී බව සඳහා දෙමාපිය පිළිවෙත්වල කාර්යභාරය විශ්ලේෂණය කරන්න. උදාහරණ මඟින් ඔබේ පිළිතුර සනාථ කරන්න. (ලකුණු 07)

(iii) පාසල් සැකසුම් තුළ සමායෝජී ගැටළු වලින් පෙලෙන දරුවන් මුහුණ දෙන අභියෝග සාකච්ඡා කරන්න. මෙම සිසුන්ට සහාය වීම සඳහා ගුරුවරුන්ට ඵලදායී ලෙස මැදිහත් විය හැක්කේ කෙසේද? අදාළ උදාහරණ සමඟ ඔබේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 08)

10. "උපදේශනය යනු විධිමත් සහ ක්‍රමානුකූල ක්‍රියාවලියකි."

(i) හැක්නි සහ කෝමියර්ගේ (Hackney & Cormier) පස් -අදියර ආකෘතිය මත පදනම්ව උපදේශන ක්‍රියාවලියේ අදියර විශ්ලේෂණය කරන්න. (ලකුණු 05)

(ii) උපදේශනයේ ආරම්භක අදියරේදී ධනාත්මක උපදේශක- සේවාදායක සම්බන්ධතාවයක් ඇති කර ගැනීමේ වැදගත්කම පරීක්ෂා කරන්න. (ලකුණු 07)

(iii) ඵලදායී උපදේශන ක්‍රියාවලිය සහතික කිරීම සඳහා උපදේශකයෙකු සතුව තිබිය යුතු අත්‍යවශ්‍ය කුසලතා විවේචනාත්මකව තක්සේරු කරන්න. සාර්ථක සේවාදායක ප්‍රතිඵල සඳහා එක් එක් කුසලතාව දායක වන ආකාරය නිරූපණය කිරීමට උදාහරණ භාවිත කරන්න. (ලකුණු 08)

11. (i) උදාහරණ සපයමින් විශේෂ අවශ්‍යතා ඇති සිසුන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශනයේ වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 05)

(ii) ආබාධිත පුද්ගලයින්ට වෘත්තීය අවස්ථා පුළුල් කිරීම සඳහා ඩිජිටල් තාක්ෂණයන් සහ සහායක තාක්ෂණ උපාංග භාවිත කළ හැකි ආකාරය ගවේෂණය කරන්න. ඔබගේ පිළිතුර උදාහරණ මගින් සනාථ කරන්න. (ලකුණු 07)

(iii) මෙම තාක්ෂණයන් හඳුන්වාදීමේදී සහ ඒවා භාවිතයට මඟ පෙන්වීමේදී වෘත්තීය උපදේශකයින් විසින් ඉටු කළ යුතු කාර්යභාරය කුමක්ද? (ලකුණු 08)

12. "ඔබ පාසල් උපදේශකවරයෙක් යැයි සිතන්න. ගුරුවරයෙක්, ඇසට ඇස යොමුවෙන් වැළකී සිටින,එකම හැසිරීම නැවත නැවත සිදුකරන සහ සම වයසේ මිතුරන් සමඟ අන්තර් ක්‍රියා කිරීමට අපහසු 6 හැවිරිදි දරුවෙකු උපදේශකවරයා වෙතට යොමු කරයි. අන්තර්කරණ පන්ති කාමරය තුළ ඔහුට සහාය වීමට ගුරුවරයාට නොහැකි වී ඇත."

(i) ඔබ මෙම දරුවා තක්සේරු කරන්නේ කෙසේද? (ලකුණු 05)

(ii) දරුවා සඳහා ඵලදායී ආධාරක සැලැස්මක් නිර්මාණය කිරීමට ඔබ ගුරුවරයාට මඟ පෙන්වන්නේ කෙසේද? උදාහරණ සමඟ ඔබගේ පිළිතුර සනාථ කරන්න. (ලකුණු 07)

(iii) දරුවා සඳහා ඵලදායී ආධාරක සැලැස්මක් නිර්මාණය කිරීමට ඔබ දෙමාපියන්ට මඟ පෙන්වන්නේ කෙසේද? උදාහරණ සමඟ ඔබගේ පිළිතුර සනාථ කරන්න. (ලකුණු 08)

13. "සමාජයෙන් බැහැර වීම හුදෙක් හැසිරීම් ගැටළුවක් පමණක් නොව සංවර්ධනයේ අනතුරු ඇඟවීමේ ලකුණකි."

(i) පාසල් යන වයසේ දරුවන් සමාජීය වශයෙන් බැහැර වීමට හේතු විශ්ලේෂණය කරන්න.(ලකුණු 05)

(ii) සමාජයෙන් බැහැර වීම සම වයසේ මිතුරන් හා පන්ති කාමර සහභාගිත්වයට බලපාන්නේ කෙසේද? (ලකුණු 07)

(iii) අඛණ්ඩ සමාජ බැහැරවීමක් පෙන්නුම් කරන ශිෂ්‍යයෙකුට සහාය වීම සඳහා උපදේශන පාදක මැදිහත්වීමේ සැලැස්මක් විස්තර කර සාධාරණීකරණය කරන්න. (ලකුණු 08)

14. (i) සුදුසු උදාහරණ භාවිත කරමින් "ශ්‍රවණාබාධ" යන යෙදුම නිර්වචනය කරන්න. (ලකුණු 05)

(ii) ශ්‍රවණාබාධ සහිත දරුවන්ගේ සුලබව නිරීක්ෂණය කළ හැකි හැසිරීම් **පහක් (05)** විස්තර කරන්න. (ලකුණු 07)

(iii) පන්ති කාමර සැකසුම් තුළ ශ්‍රවණාබාධ සහිත දරුවන්ට උපකාර කිරීම සඳහා ගුරුවරයෙකු විසින් අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටි පැහැදිලි කරන්න. (ලකුණු 08)

*-සියලුම හිමිකම් ඇවිරිණි.-*